# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2105/21 - 2019 ජනවාරි මස 09 වැනි බදාදා - 2019.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය නීතිය යටතේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, මහනගර සහා බලප්‍රදේශය සඳහා සැලසුම් කිරීමේ සහ ඉදිකිරීමේ රෙගුලාසි 2008 - 2020 සංශෝධනය කිරීම අනුමත කිරීමේ දැන්වීම**

මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය නීතියේ 8ඊ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ මහ නගර සහා බල ප්‍රදේශය සඳහා සැලසුම් කිරීමේ සහ ඉදිකිරීමේ රෙගුලාසි 2008 - 2020 සම්බන්ධයෙන් ඇතුළත් කිරීමට නියමිත යෝජිත සංශෝධනය අනුමත කරන ලද බව කලින් කලට සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය නීතියේ 8උ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය නීතියේ 8ඌ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහානගර සභා බල ප්‍රදේශය සඳහා සැලසුම් කිරීමේ සහ ඉදිකිරීමේ රෙගුලාසිවල 37(1) වගන්තියට අදාළ සංශෝධන, මෙයින් අනුමත කරමි.

*ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සංවර්ධන සැලැස්මේ ගොඩනැගිලි හා ඉදිකිරීම් රෙගුලාසි 2008 - 2020 හි 37.1 වන වගන්තිය සංශෝධනය කිරීම.*

01 ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සැලසුම් කිරීමේ සහ ඉදිකිරීමේ රෙගුලාසිවල 37(1) වගන්තිය, ''ඊ'' අන්තර් වාක්‍යය ඇතුළත් කිරීම මගින් පහත සඳහන් පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

> ''ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ මහනගර සභා බල ප්‍රදේශය සඳහා වන සැලසුම් සහ ඉදිකිරීම් රෙගුලාසිවල 6 වන උපලේඛනයේ - ඇ ආකෘතියේ සඳහන් මාර්ගෝපදේශ යටතේ යෝජිත මාර්ගයේ පළල මත නියමිත සංවර්ධනයන් සඳහා වන මහල් සංඛ්‍යාව තීරණය වන අතර, එහි අනුරූප මාර්ග ප්‍රවේශයට අවම වශයෙන් මීටර් 12 ක් (අඩි 40) පළල පාරක් හෝ විකල්ප සහ වෙනම ප්‍රවේශ මාර්ග 2ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පැවතිය හැකි අතර, අවශ්‍ය අනුමැතිය ප්‍රදානය කිරීම පිණිස අධිකාරිය වෙත පවරා ඇති ඒ අභිමතයට යටත්ව එක් එක් මාර්ගය අවම වශයෙන් මීටර් 6 ක පළලින් යුක්ත විය හැකි ය''.

පාඨලී චම්පික රණවක,
මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

දිනය ඃ 2017 ජූලි මස 14 වැනි දින,

*සැ. යු. - මෙම රෙගුලාසිය 2017 ජූලි මස 14 වන දින සිට බලපැවැත්වේ.*

01 - 556

1A - PG 4348 — 92 (2019/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*